16th March 2018

#mediaethicsSL #SinhalaPress #TamilPress #lka #SundayLankadeepa #SundayMawbima #Silumina #Rivira # Lakbima #Thinakkural #Thinakaran #SudarOli #Virakesari #March11

රටම උණුසුම් කළ දිගන සිදුවීම තෝරාගත් සිංහල සහ දමිළ පුවත්පත් මගින් වාර්තා කළ අන්දම, එහිදී දෝෂාරෝපණය බෙදී ගොස් තිබූ ආකාරය, ප්‍රහාරකයින්ව හා ප්‍රහාරයට ලක්වූවන්ව හඳුන්වා දී තිබූ ආකාරය සහ සිදුවීම පිළිබඳ සමස්ත නිර්වචනය ලබාදී තිබූ ආකාරය පහත වගු මගින් දක්වා තිබේ. මෙහිදී සිංහල පුවත්පත් මගින් බොහෝ විට ට්‍රක් රථ රියැදුරුවරයාට කළ පහරදීමේ සිට පසුව ඇතිවූ කලබලකාරී තත්වය දක්වා සමස්තය ගනිමින් මතයන් දක්වා තිබූ බවද නිරීක්ෂණය කළ හැකි විය.

රටක මෙවැනි කලබලකාරී අවස්ථාවක් උද්ගතව තිබියදී එය වාර්තා කිරීම මනා සංයමයකින්, ප්‍රවේශම් සහගත ප්‍රවේශයකින්, මාධ්‍ය ආචාර ධර්ම පිළිපදිමින් කළ යුතු බවත්, සිදුවීම වඩාත් අවුලවන ආකාරයේ වාර්තාකරණයන් සිදු නොකළ යුතු බවත් නොකිවමනායි. එසේ නමුත් මේ අතරේදීම තම වාර්තාකරණයේ නිරවද්‍යතාවය පවත්වා ගැනීමද කළ යුතු වෙයි. සැබවින්ම මෙවැනි අවස්ථාවක් වාර්තා කිරීම ඒ නයින් බැලූ කළ අසීරු කාර්යයක් වන බවද සඳහන් කළ යුතුයි. හැකිතාක් මෙවැනි සිදුවීමක් සම්බන්ධයෙන් මත නොදක්වමින්, නිවැරදි මූලාශ්‍ර භාවිතා කරමින්, මධ්‍යස්ථ භාවයකින් යුතුව වාර්තා කිරීම මනායි.

පහත වගු තුළ දැක්වෙන පුවත් වාර්තාකරණයන් මගින් කෙතරම් දුරට එම කොන්දේසි රැකී තිබේද? කෙතරම් දුරට ඒවා කඩවී තිබේද? එය පාඨක අප විසින් නිර්ණය කළ යුතු වෙයි.